# හෝල් ඩි ගොල් ශාලාව වෙන්කර ගැනීම

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සඳහා වන විවිධ රැස්වීම් , සම්මන්ත්‍රණ, පුහුණු වැඩමුළු, ප්‍රගති සමාලෝචන වැඩසටහන්, හා රාජ්‍ය උත්සව පැවැත්වීම සඳහා මෙම ශාලාව පවත්වාගෙන යනු ලබයි. ඒවාට ගැටළුවක් නොවන පරිදි ඉඩ ඇති අවස්ථාවල දී රජයේ ආයතන ප්‍රමුඛව වෙනත් ආයතන හා පාර්ශවයන් වල විවේක කාලය ඵලදායීව ගත කිරීමේ හා රසාස්වාදය ඉහළ දැමීමේ අවස්ථාවන්ටද ඉඩකඩ වෙන්කර දෙනු ඇත.

එවැනි අවස්ථා කිසිවක් නොමැති විට බාහිර ආයතන වල ඉල්ලීම් සම්බන්ධයෙන් ඉඩකඩ සලසා දිය හැකි අතර, ඒ සඳහා පහත කොන්දේසි වලට යටත්ව ශාලාව වෙන්කර දීමට සළකා බලනු ඇත.

1. උත්සවය, වැඩසටහන පැවැත්වීමට නියමිත දිනට දින 07 කට පෙර සම්පූර්ණ ගාස්තුව ගෙවිය යුතුය
2. රාජ්‍ය ආයතන නොවන ආයතන, සංවිධාන හෝ පාර්ශවයන් ශාලාව වෙන්කර ගැනීමේ දී රුපියල් දස දහසක (රු.10000/-) ඇප මුදලක් තැන්පත් කළ යුතුය,
3. උත්සවය, වැඩසටහන, සම්භාෂනය සඳහා ශාලාව භාවිත කිරීමේ දී ශාලාවට , උපකරණ හෝ දේපල වලට යම් අලාභහානියක් වුවහොත් එය ඇප මුදලින් අයකර ගනු ලැබේ. ඇප මුදල ඒ සඳහා ප්‍රමණවත් නොවන්නේ නම් හිග මුදල ශාලාව වෙන්කළ අය විසින් ගෙවිය යුතුය.
4. මුදල් ගෙවා ශාලාව වෙන්කර ගත් පසු එය අවලංගු කර ගැනීම සඳහා කරන ඉල්ලීමකදී ඇප මුදල ආපසු නොගෙවන අතර, එය රජයේ ආදාමට බැර කරනු ලැබේ.
5. ශාලාව වෙන් කිරීමේදී රජය විසින් පවත්වනු ලබන වැඩසටහන්, සම්මන්ත්‍රණ, සාකච්ඡා සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත.
6. නාට්‍ය සංදර්ශන, සංගීත සංදර්ශන, විවිධ ප්‍රසංග, පෙරපාසල් උත්සව, ප්‍රිය සම්භාෂණ, මංගල උත්සව, සුහද හමු සඳහා දින වෙන්කර තැබීමේදී අත්‍යවශ්‍යයෙන්ම සිදුකළ යුතු රාජ්‍ය උත්සවයක් යොදා ගැනීමට සිදුවුවහොත් ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට සිදුවනු ඇත.

**ගාස්තු අය කිරීම**

ගාස්තු අය කිරීම පහත පරිදි A, හා B, වශයෙන් ගාස්තු අවස්ථා 02 ක් යටතේ දක්වා ඇති අතර, ශාලාව වෙන්කළ කාලයට අමතරව පෙර සූදානම් කටයුතු හා අතිරේක සෑම පැයකටම රු.2000/- බැගින් අය කරනු ලැබේ.

වායුසමන පහසුකම් සඳහා වැයවන විදුලිය ගාස්තු, ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම්, ආරක්ෂක සේවා, සේවක අතිකාල දීමනා පහත ගාස්තු තුළ ඇතුළත්ව ඇත.

මෙම ගාස්තු සඳහා ආසන 600 ක්, පොල්තෙල් පහන් 01 ක්, මේස 02 ක් නොමිලේ සපයනු ලැබේ.

පහත සඳහන් ගාස්තු රජයේ වැඩකරන දින සඳහා පමණක් වන අතර, සති අන්ත හෝ රජයේ නිවාඩු දිනයක අදාළ වැඩසටහන් පවත්වන්නේ නම් නියමිත ගාස්තුවට අමතරව රු. 1000/- ක අතිරේක ගාස්තුවක් ගෙවිය යුතු වේ.

## A. සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන සහ වෙනත් පාර්ශවයන්

| වැඩසටහන | දිනකට (පෙ:ව:6.00 - ප:ව:6.00 අතර පැය 08 ක කාලයක් පමණයි) | වරුවකට (පැය 04 ක් පමණි) **පෙරවරුව පමණක් හෝ පස්වරුව පමණක් විය යුතුය.** |
|---|---|---|
| නාට්‍ය සංදර්ශන | 40,000/- | වෙන්කරනු නොලැබේ |
| සංගීත ප්‍රසංග | 40,000/- | වෙන් කරනු නොලැබේ |
| විවිධ ප්‍රසංග(පෙර පාසල්), පුහුණු හා වෙනත් උත්සව | 40,000/- | 20,000/- |
| මංගල උත්සව හා වෙනත් ප්‍රිය සම්භාෂණ | 50000/- | වෙන් කරනු නොලැබේ |

ඉහත වැඩසටහන් රාත්‍රී කාලයේ පවත්වන්නේ නම් (ප:ව: 6.00 පසු) රු.5000/- ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

වරුවක් සඳහා ශාලාව වෙන් කිරීම පෙරවරුව සඳහා හෝ පස්වරුව සඳහා පමණක් විය යුතු අතර, පෙරවරු හා පස්වරු දෙකටම අයත්වන පරිදි ශාලාව වෙන් කරන්නේ නම් එක් දිනයක් සඳහා වෙන්කර ගත යුතුය. (උදා: පෙරවරු 10 සිට පස්වරු 2 දක්වා.....)

**B. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා විශේෂ ගාස්තු;**

මෙම සහන ගාස්තු නියමිත ශාලා ගාස්තු සඳහා පමණක් වන අතර, වෙනත් ගාස්තු හා අමතර පහසුකම් සඳහා අදාළ නොවේ. ප්‍රිය සම්භාෂණ සඳහා සහන ගාස්තු හිමි නොවේ.

වරුවකට - රු.10000/- දිනකට - රු.20000/-

වරුවක් සඳහා ශාලාව වෙන් කිරීම පෙරවරුව සඳහා හෝ පස්වරුව සඳහා පමණක් විය යුතු අතර, පෙරවරු හා පස්වරු දෙකටම අයත්වන පරිදි ශාලාව වෙන් කරන්නේ නම් එක් දිනයක් සඳහා වෙන්කර ගත යුතුය. (උදා: පෙරවරු 10 සිට පස්වරු 2 දක්වා.....)

**ලබාගත හැකි අමතර සේවා:**

(රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික සියළුම අයවළුන් සඳහා)

| අමතර සේවා | ගාස්තුව (රු.) |
|---|---|
| 20 x 20 කූඩාරම් 01 ක් (නිල්පාට) | 3000/- |
| ශබ්ද විකාශන යන්ත්‍ර | 5000/- |
| අමතර මේස 01 ක් | 100/- |
| විශේෂ අමුත්තන්ගේ පුටු 01 ක් | 50/- |
| ප්ලාස්ටික් පුටු 01 ක් | 25/- |

| අමතර සේවා | දිනකට රුපියල්. | වරුවකට රුපියල්. |
|---|---|---|
| යාබද ශාලාව | 7000/- | 4000/- |
| එළිමහන් අංගනය | 5000/- | 3000/- |
| එළිමහන් අංගනය - ශබ්ද විකාශන කටයුතු සඳහා පමණක් විදුලි සැපයුම් සහිතව | 6000/- | 3500/- |
| එළිමහන් අංගනය - රාත්‍රී වෙන් කිරීම් සඳහා | 8000/- | |

මෙම ගාස්තු 2016.08.15 දින සිට ක්‍රියාත්මක වේ.

එස්.ටී.කොඩිකාර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

විමසීම: 091-4944809 / 091- 4944807